FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2022 ජුනි

2 වන වෙළුම - කලාප අංක 6


මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර ගෙන් ප්‍රශ්න කරයි


මහාචාර්ය නැදලගමුවේ ධම්මදින්න හිමි අත්අඩංගුවට


මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන්ට ප්‍රහාරයක්

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 29ක් 2022 ජුනි මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 07ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 20ක්, මාධ්‍යයේ ස්වාධීනත්වයට අදාළ සිදුවීම් 01ක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යටතට ගැනෙන සිදුවීම් 01ක් ඒ අතර වෙයි. සිදුවීම්වලින් බහුතරයක්, ජනාධිපතිවරයාට ඉල්ලා අස් වන ලෙස බල කරමින් රට පුරා පැනනැගුණු මහජන නැගිටීමට සම්බන්ධ සිදුවීම් වේ.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. ගෝඨාගෝගම උද්ඝෝෂකයින් ඉවත් කිරීම වළක්වන්නැයි ඉල්ලූ පෙත්සම ප්‍රතික්ෂේප වීම.
2. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම සම්බන්ධ නඩුවේ විත්තිකරුවන් යළි රිමාන්ඩ් භාරයට පත් කරන ලෙස අධිකරණය නියෝග කිරීම.
3. අතුරුදහන් කළ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ වන සන්ධ්‍යා එක්නැලිගොඩ, ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර ෆෙඩරේශනයේ 31 වැනි සමුළුව ඇමතීම.
4. අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලයේ පා ගමනකට අදාළව තහනම් නියෝගයක් නිකුත් කිරීම අධිකරණය ප්‍රතික්ෂේප කිරීම.
5. ගෝඨාගෝගම උද්ඝෝෂණයට පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම හිටපු අගමැති මහින්ද රාජපක්ෂට කළ කැඳවීම අවලංගු කිරීම.
6. ගෝඨාගෝගම අරගලභූමියට එල්ල වූ ප්‍රහාරයට වගකිවයුතු දේශපාලනඥයන්ගෙන් වන්දි ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇති පෙත්සම විභාග යට ගැනීම.

7. මැයි 9 ප්‍රහාරය සම්බන්ධයෙන් සිදු කෙරෙන විමර්ශන පිළිබඳව කනස්සල්ල පළ කරමින් නීතිඥ සංගමය නීතිපතිවරයාට ලිපියක් යොමු කිරීම.

8. ජන අරගලයේ ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් යොමු කිරීම.

9. ජන අරගලයේ ක්‍රියාකාරිකයකු වන නීතිඥ සේනක පෙරේරා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.

10. සමාජ මාධ්‍ය ක්‍රියාකාරික සම්පත් එදිරිසිංහ කන්තලේ පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.

11. කුරුණෑගල සමාජ ක්‍රියාකාරිකයින් දෙදෙනෙකුගෙන් ප්‍රශ්න කිරීම හා ඉන් එක් අයකු අත්අඩංගුවට ගැනීම.

12. 'ගෝඨාගෝගම' අරගලයේ ක්‍රියාකාරිනියක වන මේරි සොනාලි පැව්දි සොයුරිය, ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා වෙන්නප්පුව පොලිසියට කැඳවීම.

13. මාතර මහේස්ත්‍රාත් අධිකරණය මගින් උද්ඝෝෂකයකුට වසර තුනහමාරක සිරදඬුවමක් නියම කිරීම.

14. මුලතිව්හි මහජන විරෝධයක් වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදී කනපතිපිල්ලේ කුමනන්ට නාවික හමුදා නිලධාරීන් බාධා කිරීම.

15. උද්ඝෝෂණයක නිරත වූ වෘත්තීය සමිති ක්‍රියාකාරිකයින් පිරිසක් අධිකරණය හමුවට කැඳවීම.

16. ගෝල්ෆේස් අරගලකරුවන්ට එල්ල කළ ප්‍රහාරයෙන් බරපතළ තුවාල ලැබූ පී.එස්. අනුරංග මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

17. අර්බුද විමර්ශනය මැයෙන් මාර්ගගත සම්මන්ත්‍රණයක් හෑෂ්ටැග් පරපුර සංවිධානයේ මෙහෙයවීමෙන් පැවැත්වීම

18. මල්ලාවි ප්‍රදේශයේ ඉන්ධන පෝලිමක් අසල වාර්තාකරණයේ නිරතව සිටි මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන් නාඳුනන පුද්ගලයකුගේ ප්‍රහාරයට ලක් වීම

19. සමාජ මාධ්‍ය ක්‍රියාකාරික අනුරුද්ධ බණ්ඩාර ගෝල්ෆේස් අරගල භූමියේදී අත්අඩංගුවට ගැනීම.

20. ජන අරගලයේ ක්‍රියාකාරිකයකු වන අමල් සාලින්ද අත්අඩංගුවට ගැනීම.

21. ජනාධිපති ලේකම් කාර්යාලය අසල උද්ඝෝෂණයක නිරත වූ අරගලකරුවන් 21 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.

22. තමන් අත්අඩංගුවට ගැනීම වළක්වන්නැයි ජොන්ස්ටන් ප්‍රනාන්දු කළ ඉල්ලීම අභියාචනාධිකරණය ප්‍රතික්ෂේප කිරීම.

23. කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කළ නියෝගයකට අනුව මරදාන පොලිසියේ පෙනීසිටි ජන අරගලයේ ක්‍රියාකාරිකයින් 7 දෙනෙකු අධිකරණයට ඉදිරිපත් කිරීම.

24. මහජන අරගලයේ ක්‍රියාකාරිකයකු වූ යොහාන් සෙනෙවිරත්න දඹුල්ල පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.

25. පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ කටයුතු ආවරණය කිරීමට ජනමාධ්‍යවලට අවස්ථාව ලබා නොදීම.

26. ගුවන් හමුදා බුද්ධි අංශයේ පැමිණිල්ලක් මත මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.

27. ආණ්ඩුවට එරෙහි ජන අරගලයට පක්ෂව අදහස් පළ කළ මහාචාර්ය නැදලගමුවේ ධම්මදින්න හිමි අත්අඩංගුවට ගැනීම.

28. ගාලු කොටු පවුර මත පැවැති උද්ඝෝෂණයකට යුද හමුදාව බාධා කිරීම.

29. සිවිල් පුරවැසි අරගල ව්‍යාපාරයේ සම කැඳවුම්කරු රවින්ද්‍ර ජාගොඩ පෝද්දල පොලිසියට කැඳවා ප්‍රකාශයක් ලබා ගැනීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 ජුනි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 07 |
| නීතිමය කොන්දේසි | 20 |
| වෘත්තීයවේත්වය | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 01 |
| **එකතුව** | **29** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස බරපතළ ලෙස උල්ලංඝනය වූ අවස්ථා 07ක් ජුනි මාසයේදී නිරීක්ෂණය විය.**

**2 වගුව: 2022 ජුනි : ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 07**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ප්‍රහාර | 01 |
| මානසික බලපෑම් | 06 |
| **එකතුව** | **07** |

1. **ජන අරගලයේ ක්‍රියාකාරිකයකු වන නීතිඥ සේනක පෙරේරා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම**

   නිශ්චිත හේතු දැක්වීමකින් තොරව මෙම කැඳවීම සිදු කර තිබූ අතර මැයි 25 වැනිදා කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරිපිට රැස් වූ විරෝධතාකරුවන්ට නීති විරෝධී ක්‍රියා සිදු කිරීමට උපදෙස් දෙන හඬපටයක් සම්බන්ධයෙන් ඔහුගෙන් ප්‍රශ්න කර තිබේ. එය ව්‍යාජ චෝදනාවක් බව නීතිඥ සේනක පෙරේරා ප්‍රකාශ කරයි.

   මෙම කැඳවීමට විරෝධය පළ කරමින් ජුනි 6 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරිපිට උද්ඝෝෂණයක්ද පැවැත්විණි.

   මූලාශ්‍රය: www.youtube.com

2. **'ගෝඨාගෝගම' අරගලයේ ක්‍රියාකාරිනියක වන මේරි සොනාලි පැව්දි සොයුරිය, ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා වෙන්නප්පුව පොලිසියට කැඳවීම.**

   හිටපු විදුහල්පතිනියක වන මේරි සොනාලි පැව්දි සොයුරිය, දේශපාලකයකුගේ නිවස සහ දේපළ ගිනි තැබීමේ සිදුවීමක් පිළිබඳ විමර්ශනයකට අදාළ ප්‍රකාශයක් ලබාගැනීමට ජුනි 7 වැනිදා වෙන්නප්පුව පොලිසියට කැඳවා තිබිණි. කතෝලික ගිහි එකමුතුව මේ පිළිබඳව පුවත්පත් සාකච්ඡාවක් කැඳවා දැඩි විරෝධය පළ කළ අතර පසුව අදාළ කැඳවීම ඉවත් කර ගැනීමට පොලිසිය කටයුතු කර ඇත.

   මූලාශ්‍රය: www.themorning.lk

3. **මුලතිව්හි මහජන විරෝධයක් වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදී කනපතිපිල්ලේ කුමනන්ට නාවික හමුදා නිලධාරීන් බාධා කිරීම.**

   දෙමළ ජනතාව සතු ඉඩම් හෙක්ටෙයාර් 250ක් බලෙන් අැල්ලීමේ වෑයමකට එරෙහිව ජුනි 7 වැනිදා මුලතිව් දිස්ත්‍රික්කයේ වට්ටුවාක්කල් වාසීන් දැක්වූ විරෝධය වාර්තාකරමින් සිටියදී, එය වැළැක්වීම සඳහා නාවික හමුදාව මෙම බාධාකිරීම සිදු කර ඇත. අධිකාරයකින් තොරව සිය මාධ්‍ය හැඳුනුම්පත ලබගැනීමට නාවික හමුදා නිලධාරියකු දැරූ උත්සාහයට මාධ්‍යවේදියා දැඩි විරෝධය පළ කළේය.

   මූලාශ්‍රය: https://twitter.com/JDSLanka

4. **මල්ලාවි ප්‍රදේශයේ ඉන්ධන පෝලිමක් අසල වාර්තාකරණයේ නිරතව සිටි මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන් නාඳුනන පුද්ගලයකුගේ ප්‍රහාරයට ලක් වීම.**

   හමුදාව හා පොලිසියේ නිලධාරීන් ඉදිරිපිට ජුනි 17 වැනිදා මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන්ට පහරදුන් නාඳුනන පුද්ගලයා දින 2කට පසුව අත්අඩංගුවට ගත් අතර පොලිස් ඇප මත මුදාහරින ලදි.

   මූලාශ්‍රය: www.tamilguardian.com

5. **ගුවන් හමුදා බුද්ධි අංශයේ පැමිණිල්ලක් මත මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම.**

   මාස 10ක කාලයකට පෙර (2021 සැප්තැම්බර් 6 වැනිදා) කළ පැමිණිල්ලකට අදාළව මෙම කැඳවීම සිදු කර ඇති අතර හේතුව කල්තියා දැනුම් දී නැත.

   ජුනි 28 වැනිදා එම කැඳවීමට විරෝධය පළ කරමින් ජනමාධ්‍යවේදීන් සහ ක්‍රියාධරයන් කොළඹ රහස් පොලිස් මූලස්ථානය ඉදිරිපිට විරෝධතා දැක්වූ අතර 27 වැනිදා එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත සංදේශයක් බාර දෙන ලදි.

   මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

6. **ගාලු කොටු පවුර මත පැවැති උද්ඝෝෂණයකට යුද හමුදාව බාධා කිරීම.**

ශ්‍රී ලංකාව හා ඔස්ට්‍රේලියාව අතර ජූනි 30 වැනිදා පැවති ක්‍රිකට් තරගය අතරතුර නීතිඥවරුන් ඇතුළු සිවිල් ක්‍රියාකාරිකයන් පිරිසක් පැවැත්වූ මෙම සාමකාමී උද්ඝෝෂණයට කඩාවැදුණු හමුදා නිලධාරීන් විසින් උද්ඝෝෂකයන් අත තිබූ "Go Home Gota" සහ රජයට එරෙහි සටන් පාඨ ඇතුළත් පුවරු උදුරා ඉවත් කරන ලදි. මෙම සිදුවීම විදෙස් රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන්ගේද විවේචනයට ලක් විය.

මූලාශ්‍රය: [www.youtube.com](http://www.youtube.com)

7. **සිවිල් පුරවැසි අරගල ව්‍යාපාරයේ සම කැඳවුම්කරු රවින්ද්‍ර ජාගොඩ පෝද්දල පොලිසියට කැඳවා ප්‍රකාශයක් ලබා ගැනීම.**

ප්‍රාදේශීය දේශපාලනඥයකුගේ නිවසට පහර දීමට ජනතාව පෙළඹවීමේ චෝදනාවක් සම්බන්ධයෙන් මෙම කැඳවීම සිදු කර ඇති අතර අදාළ චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරන බව ඔහු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ අජිත් කුමාර ප්‍රකාශ කරයි.

මූලාශ්‍රය: [www.youtube.com](http://www.youtube.com)

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 19ක් ජූනි මාසය තුළ නිරීක්ෂණය විය. එයින් බොහොමයක් ජනාධිපතිවරයාට හා රජයට ඉල්ලා අස් වන ලෙස බල කරමින් පැන නැගුණු විරෝධතාවලට සම්බන්ධ සිදුවීම් වේ. ජූනි 9 වැනිදා සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවල චූදිතයන් ලෙස නම් කරමින් සාමකාමී අරගලයේ ක්‍රියාකාරිකයන් මර්දනය කිරීම සඳහා පොලිසිය වෑයම් කරන බව, නිරීක්ෂණයට ලක් වූ සිදුවීම් අනුව පැහැදිලිව පෙනෙන කරුණකි.**

**3 වගුව: 2022 ජූනි : නීතිමය කොන්දේසි - සිදුවීම් 20**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 19 |
| මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධවලදී දණ්ඩමුක්තිය | 01 |
| **එකතුව** | **20** |

1. **ගෝඨාගෝගම උද්ඝෝෂකයින් ඉවත් කිරීම වළක්වන්නැයි ඉල්ලූ පෙත්සම ප්‍රතික්ෂේප වීම.**

'ගෝඨාගෝගම' අරගලකරුවන් එම ස්ථානයෙන් ඉවත් කිරීමට රජය පියවර ගැනීම වළකාලන නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා සිවිල් ඉංජිනේරු මෙහොමඩ් හුස්ලි හමීන් විසින් ගොනුකරනු ලැබූ මූලික අයිතිවාසකම් පෙත්සමක් විභාගයට ගැනීම ශ්‍රේෂ්ඨාධිකරණය ජූනි 2 වැනිදා ප්‍රතික්ෂේප කළේය. නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥ ෂමීන්ද්‍ර වික්‍රම ප්‍රකාශ කර සිටියේ 'ගෝඨාගෝගම' අරගලයට දින 50ක් ඉක්මවා ඇති බවත් එය සාමකාමීව සිදු වන උද්ඝෝෂණයක් වන බැවින් කිසිදු ආකාරයකට රාජ්‍ය බලය යොදා මර්දනය කර නොමැති බවයි.

මූලාශ්‍රය: [www.a5news.lk](http://www.a5news.lk)

2. **මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් කිරීම සම්බන්ධ නඩුවේ විත්තිකරුවන් යළි රිමාන්ඩ් භාරයට පත් කරන ලෙස අධිකරණය නියෝග කිරීම.**

ඉහත නඩුවේ විත්තිකරුවන් වන ගිරිතලේ හමුදා කඳවුරේ හිටපු අණදෙන නිලධාරී ෂම්මි කුමාරරත්න ඇතුළු, යුද්ධ හමුදා බුද්ධි අංශ සාමාජිකයින් 9 දෙනෙකු සාක්ෂිකරුවන්ට බලපෑම් කිරීමේ චෝදනාව මත ඇප අවලංගු කර රක්ෂිත බන්ධනාගාරගත කිරීමට විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය නියෝග කළේය. නඩුව ජූලි 27 වැනිදාට කල් තබන ලදි.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

3. **අතුරුදහන් කළ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ වන සන්ධ්‍යා එක්නැලිගොඩ, ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර ෆෙඩරේශනයේ 31 වැනි සමුළුව ඇමතීම.**

විශේෂ ආරාධිතයකු ලෙස සහභාගී වූ සන්ධ්‍යා එක්නැලිගොඩ, සිය අත්දැකීම් ඇසුරෙන් ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් වන දණ්ඩමුක්තිය පිළිබඳව පැවැත්වූ දේශනය සම්මේලනයේ විශේෂ අවධානයට ලක් විය.

2022 මැයි 31 - ජූනි 03 දක්වා ඕමානයේ මස්කට්

නුවර පැවැති මෙම සමුළුව රටවල් 156ක ආරාධිත නියෝජිතයන් 400කගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කරු ලසන්තද සිල්වා, ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති දුමින්ද සම්පත් සහ මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනයේ ලේකම් ධර්මසිරි ලංකාපේලි මෙම අවස්ථාවට සහභාගි වූහ.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

4. **අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලයේ පා ගමනකට අදාළව තහනම් නියෝගයක් නිකුත් කිරීම අධිකරණය ප්‍රතික්ෂේප කිරීම.**

උද්ඝෝෂකයින්, මං මාවත් කීපයකට ඇතුළුවීම වැළැක්වීමේ නියෝගයක් නිකුත් කරන ලෙස කුරුඳුවත්ත පොලිසිය විසින් ජුනි 2 වැනිදා කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් නන්දන අමරසිංහ ප්‍රකාශ කළේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තිය යටතේ සාමකාමී ලෙස උද්ඝෝෂණය පැවැත්වීමට හිමිකමක් තිබෙන බවයි.

මූලාශ්‍රය: runews.lk

5. **ගෝඨාගෝගම උද්ඝෝෂණයට පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම හිටපු අගමැති මහින්ද රාජපක්ෂට කළ කැඳවීම අවලංගු කිරීම.**

හිටපු අගමැතිවරයාට ජුනි 1 වැනිදා මානව හිමිකම් කොමිසම හමුවේ පෙනී සිටින ලෙස මීට පෙර දැනුම් දී තිබුණු අතර, සිද්ධිය සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන්ගෙන් හා වින්දිත පාර්ශ්වයෙන්ද ප්‍රකාශ සටහන් කර ගැනීම අවසන් නොමැති බැවින් අදාළ කැඳවීම කල් දැමූ බව කොමිසම ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: www.newsfirst.lk

6. **ගෝඨාගෝගම අරගලභූමියට එල්ල වූ ප්‍රහාරයට වගකිවයුතු දේශපාලනඥයන්ගෙන් වන්දි ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇති පෙත්සම විභාගයට ගැනීම.**

ඉහත ප්‍රහාරය මගින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධව එක් වගඋත්තරකරුවකු රුපියල් මිලියන 500 බැගින් තම පුද්ගලික ධනයෙන් වන්දි ගෙවිය යුතු යැයි නියෝග කරන ලෙස ඉල්ලා පවරා ඇති මෙම නඩුව :SCFR/168/2022) ජුනි 01 වන දින විභාගයට ගැනිණි. නීතිඥ නාගානන්ද කොඩිතුවක්කු විසින් මෙම නඩුව පවරා ඇත.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

7. **ජන අරගලයේ ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් යොමු කිරීම.**

තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය හා තරුණ නීතිවේදීන්ගේ සංගමය විසින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර තිබේ. 'ගෝඨාගෝගම' ප්‍රහාරයෙන් පසුව රට පුරා ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියාවලට සම්බන්ධ බවට චෝදනා එල්ල කරමින් 2000කට අධික පිරිසක් අත්අඩංගුවට ගෙන ඇති බවත් මෙම අත්අඩංගුවට ගැනීම් රාජ්‍ය මර්දනයක ස්වරූපයෙන් ක්‍රියාත්මක වන බැවින් රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මූලික මිනිස් අයිතිවාසිකම් සම්බන්ධයෙන් බරපතළ ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වී තිබෙන බවත් එමගින් පෙන්වා දී ඇත.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

8. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරික සම්පත් එදිරිසිංහ කන්තලේ පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.**

සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු හා Mother Trinco ෆේස්බුක් පිටුවේ පරිපාලක සම්පත් එදිරිසිංහ, ආණ්ඩු පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී කපිල අතුකෝරාළගේ නිවස ඉදිරිපිට පැවති විරෝධතාවක් පිළිබඳ වීඩියෝවක් සමාජ මාධ්‍ය මගින් බෙදාහැරියේය යන චෝදනාව මත ජුනි 6 වැනිදා කන්තලේ මූලස්ථාන පොලිසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදි. ජුනි 7 වැනිදා කන්තලේ මහේස්ත්‍රාත් අධිකරණට ඉදිරිපත් කිරීමෙන් පසු ඔහු ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: https://twitter.com/JDSLanka

9. **කුරුණෑගල සමාජ ක්‍රියාකාරිකයින් දෙදෙනෙකුගෙන් ප්‍රශ්න කිරීම හා ඉන් එක් අයකු අත්අඩංගුවට ගැනීම.**

කුරුණෑගල 'ගෝඨාගෝගම' විරෝධතා ව්‍යාපාරය හා සම්බන්ධ ක්‍රියාකාරීන් වන අදීප ඒකනායක හා ප්‍රින්ස් ජයසූරිය යන දෙදෙනා ජුනි 7 වැනිදා කුරුණෑගල නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට කැඳවා, රඳවාගෙන ප්‍රශ්න කෙරුණු අතර, අදීප ඒකනායක අත්අඩංගුවට ගෙන කුරුණෑගල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලදුව ඇප නියම කෙරිණි.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

10. **මාතර මහේස්ත්‍රාත් අධිකරණය මගින් උද්ඝෝෂකයකුට වසර තුනහමාරක සිරදඬුවමක් නියම කිරීම.**

ඉන්ධන හිඟයට එරෙහිව අප්‍රේල් 19 මාතර පැවති විරෝධතාවකදී මාර්ගයක් හරස් කිරීම හා 'දේපළ හානි කිරීමේ' චෝදනා මත මාතර මැද්දවත්ත පදිංචිකරුවකු වූ ඊ.ඩී. නිරංජන් ලක්ෂාන් (30) යන අයට මාතර මහේස්ත්‍රාත් විසින් අවුරුදු 3 හමාරක බරපතළ වැඩ

සහිත සිර දඬුවමක් හා රු. 56,000ක දඩයක් ජුනි 6 වැනිදා නියම කරන ලදී.

මූලාශ්‍රය: www.newswire.lk

11. **උද්ඝෝෂණයක නිරත වූ වෘත්තීය සමිති ක්‍රියාකාරිකයින් පිරිසක් අධිකරණය හමුවට කැඳවීම.**

මැයි 9 ප්‍රහාරය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක නොකිරීමට එරෙහිව මැයි 25 වැනිදා පැවති උද්ඝෝෂණයකදී පොලිස් රාජකාරියට බාධා කිරීමේ චෝදනාව මත වෘත්තීය සමිති ක්‍රියාධරයන් ඇතුළු ජන අරගලයේ ක්‍රියාකාරීන් 5 දෙනකුට ජුනි 13 වැනිදා කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටින ලෙස දන්වා ජුනි 7 වැනිදා සිතාසි භාර දෙන ලදී. මේ සම්බන්ධයෙන් වෘත්තීය සමිති හා බහුජන සංවිධානවල දැඩි විරෝධය පළ විය.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

12. **ගෝල්ෆේස් අරගලකරුවන්ට එල්ල කළ ප්‍රහාරයෙන් බරපතළ තුවාල ලැබූ පී.එස්. අනුරංග මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.**

ප්‍රහාරය සිදු වී මාසයක කාලයක් ගත වී ඇතත්, එහි වින්දිතයින් වූ තමන් ඇතුළු 30 දෙනෙකුට අධික පිරිසකට තවමත් සාධාරණය ඉටු වී නොමැති බවත්, ප්‍රධාන වගකිවයුත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට පොලිසිය අපොහොසත් වී ඇති බවත් ඔහු කියා සිටී.

මූලාශ්‍රය: www.facebook.com

13. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරික අනුරුද්ධ බණ්ඩාර ගෝල්ෆේස් අරගල භූමියේදී අත්අඩංගුවට ගැනීම**

ජනතාව අතර නොසන්සුන්තාවක් ඇති වන ආකාරයේ අදහස් සමාජ මාධ්‍ය ඔස්සේ පළ කළේය යන චෝදනාව මත ජුනි 20 වැනිදා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ සමාජ මාධ්‍ය ක්‍රියාකාරික අනුරුද්ධ බණ්ඩාර නිදහස් කිරීමට අධිකරණය නියෝග කළේය. ඔහු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ සාලිය පීරිස් පෙන්වා දුන්නේ සැකකරුට එරෙහි චෝදනා පවත්වාගෙන යෑමට නොහැකි බවයි.

මූලාශ්‍රය: http://www.adaderana.lk
https://www.facebook.com

14. **ජන අරගලයේ ක්‍රියාකාරිකයකු වන අමල් සාලින්ද අත්අඩංගුවට ගැනීම.**

වරෙන්තුවක් ඇති බව පවසා පසුගිය ජුනි 20 වැනිදා ඔහු අත්අඩංගුවට ගෙන වරාය පොලිසියේ රඳවා තබන ලද අතර, කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. අත්අඩංගුවේ සිටියදී නීතිඥ සහාය ලබා ගත යුතු බවට ඔහු ඉල්ලා සිටියද පොලිසිය ඊට ඉඩ නොදුන් බව නීතිඥවරු පවසති.

මූලාශ්‍රය: www.facebook.com
thesinhalanews.lk

15. **ජනාධිපති ලේකම් කාර්යාලය අසල උද්ඝෝෂණයක නිරත වූ අරගලකරුවන් 21 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රවේශය අවහිර කිරීම ඇතුළු චෝදනා මත 20 වැනිදා උදෑසන මෙම පිරිස අත්අඩංගුවට ගැනුණු අතර පස්වරුවේ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු. ලක්ෂ 5 බැගින් වූ ශරීර ඇප මත මුදාහැරිණි. අත්අඩංගුවට පත් වූවන් අතර භික්ෂුවක්, පිරිමි 16ක් සහ කාන්තාවන් 04ක් වන බව පොලිස් මාධ්‍ය කොට්ඨාසය නිවේදනය කළේය.

මූලාශ්‍රය: www.youtube.com
ceylontoday.lk

16. **තමන් අත්අඩංගුවට ගැනීම වළක්වන්නැයි ජොන්ස්ටන් ප්‍රනාන්දු කළ ඉල්ලීම අභියාචනාධිකරණය ප්‍රතික්ෂේප කිරීම.**

ගාලුමුවදොර අරගලයට පහරදීමේ සිදුවීමට අදාළව තමන් අත්අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝගයක් නිකුත් කරන ලෙස පා.ම. ජොන්ස්ටන් ප්‍රනාන්දු කළ ඉල්ලීම ජුනි 21 වැනිදා අභියාචනාධිකරණය විසින් ප්‍රතික්ෂේප කෙරිණි.

අදාළ සිදුවීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මන්ත්‍රීවරයා සැකකරුවකු ලෙස නම් කළ අතර ඒ අනුව ඔහු අත්අඩංගුවට ගන්නා ලෙස කොටුව මහේස්ත්‍රාත් අධිකරණය පසුගිය 10 වනදා වරෙන්තුවක් ද නිකුත් කළේය. එය වැළැක්වීමේ නියෝගයක් ඉල්ලා ඔහු අභියාචනාධිකරණයට මෙම පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

මූලාශ්‍රය: www.newsfirst.lk

17. **කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කළ නියෝග යකට අනුව මරදාන පොලිසියේ පෙනීසිටි ජන අරගලයේ ක්‍රියාකාරිකයින් 7 දෙනෙකු අධිකරණයට ඉදිරිපත් කිරීම.**

ලහිරු වීරසේකර, ජගත් මනුවර්ණ, ජෙහාන් අප්පුහාමි, රත්කැරැව්වේ ජිනරතන හිමි, ධම්මික මුණසිංහ, එරංග ගුණසේකර සහ රතිඳු සේනාරත්න යන ක්‍රියාකාරිකයින් ජුනි 22 වැනිදා මෙසේ අධිකරණයට ඉදිරිපත් කෙරුණු අතර, ජූලි 01 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත

කිරීමට අධිකරණය නියෝග කළේය. පසුගිය ජූනි 9 සහ 10 දිනවල කොටුව සහ තලංගම ප්‍රදේශයේදී පැවැත්වූ විරෝධතාවලදී පොදු දේපළවලට හානි සිදු කළ බවට ඔවුන්ට එරෙහිව චෝදනා ගොනු කොට තිබිණි.

මූලාශ්‍රය: www.lankaweb.lk

18. **පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ කටයුතු ආවරණය කිරීමට ජනමාධ්‍යවලට අවස්ථාව ලබා නොදීම.**

පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ (පොදු ව්‍යාපාර කාරක සභාව) විමර්ශන රැස්වීම් ආවරණය කිරීම සඳහා මින් ඉදිරියට මාධ්‍යයට අවස්ථාව ලබා නොදෙන බව ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ජොන්ස්ටන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා ජූනි 23 වැනිදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේය. මෙය ජනමාධ්‍ය සතුව තිබූ අයිතියක් උදුරාග ැනීමක් මෙන්ම ජනතාව සතු මූලික අයිතිවාසිකමක් වන 'තොරතුරු දැනගැනීමේ අයිතිය අහිමි කිරීමක් බවත් විනිවිදභාවය හා වගවීම යන යහපාලන මූලධර්මවලට පිටු පෑමක් බවත් අවධාරණය කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, එම තීරණය වහා අත්හිටුවන ලෙස අදාළ වගකිවයුත්තන්ගෙන් ඉල්ලා සිටියේය.

මූලාශ්‍රය: www.ada.lk

19. **මහජන අරගලයේ ක්‍රියාකාරිකයකු වූ යොහාන් සෙනෙවිරත්න දඹුල්ල පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.**

රජයේ දේපළවලට හානි සිදු කිරීමේ චෝදනාව මත ජූනි 27 වැනිදා පොලිසිය මගින් ඔහු අත්අඩංගුවට ගනු ලැබූ අතර ඔහු රිමාන්ඩ් භාරයට පත් කිරීමට පොලිසිය ඉදිරිපත් කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කළ දඹුල්ල මහේස්ත්‍රාත් අධිකරණය ඔහුට ඇප නියම කළේය. නීතිඥ නාගානන්ද කොඩිතුවක්කු ඇතුළු නීතිඥවරු පිරිසක් යොහාන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියහ.

මූලාශ්‍රය: www.youtube.com

20. **ආණ්ඩුවට එරෙහි ජන අරගලයට පක්ෂව අදහස් පළ කළ මහාචාර්ය නැදලගමුවේ ධම්මදින්න හිමි අත්අඩංගුවට ගැනීම.**

මැයි 9 වැනිදා ප්‍රසන්න රණතුංග ඇමතිවරයාගේ නිවසට පහරදීමට පිරිස් මෙහෙයවූ බවට චෝදනා කරමින් මත කැළණිය විශ්වවිද්‍යාලයේ නූතන භාෂා අංශයේ මහාචාර්ය නැදලගමුවේ ධම්මදින්න ගම්පහ පොලිසිය මගින් ජූනි 27 වැනිදා අත්අඩංගුවට ගන්නා ලදි. ගම්පහ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ හිමියන් ඇප මත නිදහස් කෙරිණි.

මූලාශ්‍රය: JDS Lanka reports

## ව්‍යුහාත්මක කොන්දේසි

**'ව්‍යුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' සහ දර්ශකයට අයත් වන එක් අවස්ථාවක් ජූනි මාසයේදී නිරීක්ෂණය විය.**

**4 වගුව: 2022 ජූනි : ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 01 |
| **එකතුව** | **01** |

1. **මැයි 9 ප්‍රහාරය සම්බන්ධයෙන් සිදු කෙරෙන විමර්ශන පිළිබඳව කනස්සල්ල පළ කරමින් නීතිඥ සංගමය නීතිපතිවරයාට ලිපියක් යොමු කිරීම.**

ප්‍රහාරය මෙහෙයවූවේ කවුද යන්නත්, ප්‍රහාරය වැළැක්වීමට කටයුතු නොකළ ඉහළ පොලිස් නිළධාරීන් කවුද යන්නත් පැහැදිලිව දක්නට තිබියදීත් ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වන බවක් නොපෙනෙන බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නීතිපතිවරයාගේ උපදෙස් අනුව කටයුතු කර නොමැති බවද නීතිඥ සංගමය සිය ලිපියෙන් නීතිපතිවරයාට පෙන්වා දී තිබේ.

මූලාශ්‍රය: www.youtube.com

## වෘත්තීයවේදිත්වය

**මාධ්‍යවේදීන්ගේ අධ්‍යාපනය හා පුහුණුව, සිය වෘත්තීය කාර්යභාරය පිළිබඳ මාධ්‍යවේදීන්ගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පළිගැනීම යනාදී දර්ශක 6ක් මෙම සංරචකයට අයත් වේ. ඒ අතරින් ඉහත සඳහන් පළමු දර්ශකයට අයත් වන එක් සිදුවීමක් ජුනි මාසය තුළ දී නිරීක්ෂණය විය.**

**5 වගුව: 2022 ජුනි : වෘත්තීයවේදිත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් සහ පුහුණුවක් තිබීම | 01 |
| **එකතුව** | **01** |

1. **'අර්බුද විමර්ශනය' මැයෙන් මාර්ගගත සම්මන්ත්‍රණයක් හෑෂ්ටැග් පරපුර සංවිධානයේ මෙහෙයවීමෙන් පැවැත්වීම**

   නිලධාරීන් වගවීමේ ක්‍රියාවලියක රඳවා ගැනීම සම්බන්ධයෙන් ගවේෂණාත්මක පුවත්පත් කලාවට කළ හැකි කාර්යභාරය කෙරෙහි මෙහිදී අවධානය යොමු කෙරිණි. ජුනි 15 වැනිදා පැවැති මෙහි ප්‍රධාන දේශනය අන්තර්ජාතික මාධ්‍ය පුහුණුකරුවකු වන පර්වේස් ඛාන් (Pervez Khan) විසින් පැවැත්වූ අතර සෙසු සම්පත්දායකයින් වූයේ ෂහීර් අනීස්, කමන්ති වික්‍රමසිංහ හා සඳුන් අරෝෂ ප්‍රනාන්දු ය.

   මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

**6 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි- ජුනි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි - මැයි | | 2022 ජුනි |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 28 | | 07 |
| නීතිමය කොන්දේසි | 26 | 11 | 20 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | 04 | | 01 |
| වෘත්තීයවේදිත්වය | 02 | 01 | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 10 | 01 | 01 |
| **එකතුව** | **70** | **08** | **29** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-මැයි මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25